# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1502/10 – 2007 ජුනි 20 වැනි බදාදා – 2007.06.20

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 44(2) වගන්තිය සමග කියවිය යුතු 2007 අංක 15 දරන සංශෝධන පනත මගින් සංශෝධිත 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 12 වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සාදන ලද නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,

2007 ජුනි මස 18 වැනි දින,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,

කොළඹ.

නියෝග

01. 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වගන්තියට අදාලව සාදන ලද, 2006 මැයි 30 දිනැති අංක 1447/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග, ඒ යටතේ මින් පෙර සිදු කරන ලද යම්කිසිවකට අගතියක් නොවන සේ මෙයින් අවලංගු කරනු ලැබේ.

02.1 3 වන නියෝගයෙහි යම් ඡේදයක සඳහන් යම් වෙළඳාමක හෝ ව්‍යාපාරයක නිරත යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් 2007 අප්‍රේල් 01 දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් අදාළ කාර්තුවක් සඳහා,

(i) එම වෙළඳාමෙන් හෝ ව්‍යාපාරයෙන් එම කාර්තුව සඳහා ලබන පිරිවැටුම එම ඡේදයට අනුකූලව නිශ්චය කිරීම,
(ii) ඉහත සඳහන් පනතේ 2 වගන්තියේ (2) උප වගන්තියේ (එහි අතුරු විධානයෙහි කරුණු හැර) විධිවිධාන නොසලකා හැරීම; සහ
(iii) එසේ නිශ්චය කරන ලද පිරිවැටුම සම්බන්ධයෙන් ඉහත සඳහන් පනතේ උප ලේඛනයේ විෂයාංක 12 හි නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයට අනුව ආර්ථික සේවා ගාස්තුව ගණනය කිරීම.

කළ හැකිය.

02.2 එසේ කටයුතු කළ යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් සියලු කාර්යයන් සඳහා ඉහත සඳහන් පනතේ උපලේඛනයට අනුකූලව ක්‍රියා කර ඇති සේ සලකනු ලැබිය යුතුය.

03. යම් භාණ්ඩ මෙහෙයුම්කරුවෙකුගේ වෙළඳාමක හෝ ව්‍යාපාරයක යම් අදාළ කාර්තුවක් සඳහා පනතේ 2 වගන්තියේ (3) උප වගන්තියේ (ආ) ඡේදයට අනුකූලව නිශ්චය කරන ලද පිරිවැටුමෙන්, යම් තැනැත්තෙකු සතු හෝ එම තැනැත්තා විසින් කුලියට ගන්නා ලද යම් නැවකට හෝ ගුවන් යානයකට පටවන ලද යම් නැව් බඩු එම තැනැත්තා විසින් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් එම තැනැත්තාට එම භාණ්ඩ

මෙහෙයුම්කරුවා විසින් ගෙවිය යුතු මුදල අඩු කළ යුත්තේය.

04. යම් අදාල කාර්තුවක් සඳහා

(i) යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් පවත්වාගෙන යනු ලබන ආනයනය කරන ලද රළු දියමන්ති කපා ඔප දමා අපනයනය කරන වෙළඳාමක හෝ ව්‍යාපාරයක එම කාර්තුව සඳහා එම රළු දියමන්තිවල මී. ර. ගැ. (CIF) වටිනාකම ඉක්මවන එම අපනයනවල නැ. තෙ. නො. (FOB) වටිනාකමේ අතිරික්තය:

(ii) යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් පවත්වාගෙන යනු ලබන NFE පදනම මත ආනයනය කළ ද්‍රව්‍යවලින් නිපදවන ලද ඇඟලුම් අපනයනය කිරීමේ වෙළඳාමක හෝ ව්‍යාපාරයක එම කාර්තුව සඳහා එවැනි ද්‍රව්‍යයන්ගේ මී.ර.ගැ.(CIF) වටිනාකම ඉක්මවන එම අපනයනවල නැ. තෙ. නො. (FOB) වටිනාකමේ අතිරික්තය:

(iii) යම් ප්‍රාථමික වෙළෙන්දෙකු විසින් :

- සුරැකුම් පත් මිලදී ගැනීම සඳහා එම කාර්තුව තුළ ආයෝජනය කළ මුදල, සහ
- එම කාර්තුව තුළ දී එළඹෙන ලද යම් ප්‍රති මිලදී ගැනීමේ ගණුදෙනුවකට අදාළව ගෙවූ පොලිය හෝ ඉඩ ලබා දුන් වට්ටම

යන දෙකෙහි එකතුව ඉක්මවන එම ප්‍රාථමික වෙළෙන්දා සතුව තිබූ සුරැකුම් පත් විකිණීමෙන් ලැබෙන මුදලේ අතිරික්තය:

එකී වෙළඳාමේ හෝ ව්‍යාපාරයේ පිරිවැටුම විය යුත්තේය.

ඉහත පනතේ 2 වගන්තියෙහි (3) උප වගන්තියෙහි පිරිවැටුම නිර්වචනය කිරීමේදී පිළිවෙලින් (අ) ඡේදයේ හා (ආ) ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති අඩු කිරීම් සහ එකතු කිරීම් පිළිබඳව නිසි සැලකිල්ල දැක්විය යුතුය.

05. මෙම නියෝගවල,

(i) "භාණ්ඩ මෙහෙයුම්කරු" යනුවෙන් අදහස් කෙරෙන්නේ භාණ්ඩ මෙහෙයුම්කරුවෙකු ලෙස විනිමය පාලන පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති-

- භාණ්ඩ මෙහෙයුම්කරුවන්ගේ "සියළු අවදානම් සහ නෛතික බැඳීම් රක්ෂණ ආවරණය" මගින් ආවරණය වන භාණ්ඩ ප්‍රවාහනය පිළිබඳ බහුවිධ ලියකියවිලි නිකුත් කරන ; සහ
- යම් අදාළ කාර්තුවක් සඳහා අදාළ පිරිවැටුමේ වාර්තාව සමග විනිමය පාලන පනතේ 29 ආ වගන්තිය යටතේ විනිමය පාලක විසින් නිකුත් කරන ලද නිවේදනයේ තුන්වන (3) උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍රයේ පිළියෙල කරන ලද අදාළ කාර්තුවක් සමන්විත වන එක් එක් මාසය සම්බන්ධයෙන් විනිමය පාලක වෙත ඉදිරිපත් කළ ප්‍රකාශනවල පිටපත් සහ සතරවන, පස්වන සහ හයවන උපලේඛනයන් හි නිශ්චිත ලෙස දක්වා ඇති ආකෘති පත්‍රයේ පිළියෙල කරන ලද ශුද්ධ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කරන,

තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයකි.

(ii) "තැනැත්තා" යන්නට 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනතේ 17 වගන්තිය යටතේ ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තෙකු ද ඇතුළත් වේ.

(iii) "ප්‍රාථමික වෙළෙන්දා" යන්නෙහි අර්ථය 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 217 වගන්තියෙහි දී ඇති අර්ථයම වේ.

(iv) "සුරැකුම් පත්" යන්නෙන්

(අ) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත (420 පරිච්ඡේදය) යටතේ නිකුත් කර ඇති සුරැකුම් පතක් හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක්,

(ආ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත (417 පරිච්ඡේදය) යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පතක්; හෝ

(ඇ) මුදල් නීති පනතේ (422 පරිච්ඡේදය) 134 වගන්තිය යටතේ නිකුත් කරන ලද මහ බැංකු සුරැකුම් පතක්

අදහස් කෙරේ.

07-58

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.